## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/216/2023 (PSC)**

පී.ඩබ්.ලංකාවන්ද්‍ර
**අභියාචක**

**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2025.09.09**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් නීතිඥ එස්.ඒ.කොල්ලුරේ මහතා
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම්, කේ.ඩී.එන්.එම්. දේශප්‍රිය මහත්මිය.

**-නියෝගය-**

**විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා**

අභියාචක වන පී.ඩබ්.ලංකාවන්ද්‍ර යන අය විසින් 2023.12.07 දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයෙහි සඳහන් කර ඇත්තේ, ඔහුගේ රාජකාරී ජීවිත කාලයටම බලපාන අන්දමේ විනය නියෝගයක් වන **''තදින් තරවටු කිරීම''** යන දඬුවම ඔහු වෙත පැනවීම හේතුවෙන් දැනටමත් සුදුසුකම් ලබා ඇති ඔහුගේ උසස්වීම ලබා ගැනීමට එය බාධාවවක් වී ඇති හෙයින් එකී විනය දඬුවමෙන් නිදහස් කරන ලෙසයි. ඉහත කී විනය දඬුවම පැනවීමට හේතු වී ඇත්තේ, අභියාචකට එරෙහිව පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයකින් අනතුරුව ඔහු වෙත ඉදිරිපත් කර තිබූ චෝදනා තුනක් අතුරින් දෙකකට ඔහුව වැරදිකරු බවට පත් කර තිබීමයි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම් විසින්, ඔහුගේ 2020.07.02 දිනැති ලිපිය මඟින් අභියාචකට එරෙහිව චෝදනා තුනක් ඉදිරිපත් කර තිබුණි. විධිමත් විනය පරීක්ෂණය පැවැත් වූ පරීක්ෂණ නිළධාරියා විසින් එම චෝදනා තුනෙන්, පළවන චෝදනාවෙන් අභියාචක නිදොස් කොට නිදහස් කර ඇත. අභියාචකට එරෙහිව ඉදිරිපත් කර තිබූ II සහ III චෝදනා වලට ඔහු වරදකරු බවට පත් කර ඇත. විනය පරීක්ෂණය පැවැත්වූ නිළධාරියාගේ වාර්ථාව සළකා බලා, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉහත කී II සහ III චෝදනා වලට අභියාචක වැරදිකරු කිරීම හේතුවෙන් ඔහුගේ 2023.03.02 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත **"තදින් තරවටු කිරීම"** යන දඬුවම පනවා ඇත. එකී විනය නියෝගයට එරෙහිව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් සලකා බැලීමෙන් පසු, එකී කොමිෂන් සභාව අභියාචකගේ අභියාචනය ප්‍රතික්ෂේප කර ඇත. ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023.11.09 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත දැනුම් දී ඇත.

එම තීරණයට එරෙහිව අභියාචක ඉහත කී 2023.12.07 දිනැති අභියාචනය මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇත. එබැවින් මෙම විනිශ්චය අධිකාරය විසින් තීරණය කළ යුතු වන්නේ, ඔහු වෙත පනවා ඇති විනය දඬුවමෙන් නිදහස් කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු තිබේද යන්නයි.

අභියාචක වැරදිකරු බවට පත් කර ඇත්තේ ඔහුට එරෙහිව ඉදිරිපත් කර තිබූ II සහ III චෝදනා සම්බන්ධයෙනි. ඒ අතරින් III වන චෝදනාව පවත්වාගෙන යාහැකි වන්නේ, II වන චෝදනාව සම්බන්ධයෙන් ගනු ලබන තීරණය මතය. II වන චෝදනාවේ හරය වන්නේ, අභියාචක තම්මැන්නාව ප්‍රාදේශීය රෝහලේ රාජකාරී සඳහා අනුයුක්තව සිටියදී, 2018.07.14 දින සවස 4.00ත්- 4.30 අතර දක්වා වූ කාලය තුළ, නිවාඩු අනුමත කර ගැනීමකින් තොරව හෝ ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා දැනුවත් නොකර හෝ නිසි අවසරයකින් තොරව, රෝහල් පරිශ්‍රයෙන් බැහැරව සිටිමින් රාජකාරිය පැහැර හැර තිබීමයි. ඒ අනුව තීරණය කළ යුතු ප්‍රධාන කරුණ වන්නේ අභියාචක ඉහත කී පැය

භාගයක පමණ කාලය තුළ රෝහල් පරිශ්‍රයෙන් බැහැර වී සිටිමින් රාජකාරිය පැහැර හැර තිබේද යන්නයි.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක, වෛද්‍ය එන්.සී.ඩී.ආරියරත්න යන අය ඔහුගේ සාක්ෂියෙහි සඳහන් කර ඇත්තේ, අභියාචක සේවය කරන ලද තම්මැන්නාව ප්‍රාදේශීය රෝහලේ එක් වෛද්‍යවරයකු පමණක් අනුයුක්තව සිටි බවත්, එබැවින් ඔහු දිනයේ පැය 24 තුළම සේවය සැපයිය යුතු බවත්ය. වෛද්‍ය නිළධාරියා සේවයෙන් බැහැරව යන්නේ නම් ඒ සඳහා සහන නිළධාරියකු යෙදවිය යුතු බවටත් ඔහු ප්‍රකාශ කර ඇත. මෙම සිද්ධිය සිදු වී ඇති අවස්ථාවේ තම්මැන්නාව රෝහලේ සේවය කරන ලද්දේ අභියාචක වෛද්‍යවරයා පමණි. සිද්ධියට අදාළ දිනය වන 2018.07.14 වන දින, අභියාචක මෙම රෝහලෙහි පස්වරු 4.00 දක්වා සේවය කර ඇත. එම කරුණ විවාදයෙන් තොරව පිළිගෙන ඇත. අභියාචක සඳහන් කරන පරිදිම, ඔහු එදින පස්වරු 4.00ට රෝහලින් ඉවත්ව ගොස් ඇත. එසේ පිටව ගොස් සිටි අවස්ථාවේ ඔහුගේ දුරකථනයට ලැබුණු පණිවිඩයක් මත ඔහු නැවත රෝහල වෙත පස්වරු 4.30ට පෙර පැමිණ ඇත.

මෙසේ සේවයෙන් බැහැරව සිටීම සඳහා නිසි අවසරයක් ලබා ගෙන නොමැති බව චෝදක පක්ෂය විසින් ඉදිරිපත් කර ඇති තත්ත්වයයි. ඔහුට ඉදිරිපත් කර ඇති චෝදනාව වන්නේද එයයි. එසේ නම් ඇත්ත වශයෙන්ම අභියාචක එම කාලපරිච්ඡේදය තුළ අවසරයකින් තොරව චේතනාත්මකව රාජකාරියෙන් බැහැර සිට තිබේදැයි සලකා බැලිය යුතුය.

විධිමත් විනය පරීක්ෂණයේදී ප්‍රථමයෙන් සාක්ෂි දී ඇති ආර්.ඩබ්.වී.බණ්ඩා යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ, 2018.07.14 ඔහු තම්මැන්නාව රෝහලේ රාජකාරියෙහි නියුතුව සිටි බවත්, එදින පස්වරු 4 ට 4.05 ට පමණ අභියාචක රෝහලෙන් පිටත්ව ගිය බවයි. අනතුරුව එදින සවස 4.15ට පමණ හදිසි අනතුරකට භාජනය වූ රෝගීන් තිදෙනෙකු රෝහල වෙත ගෙන ආ බව ඔහු ප්‍රකාශ කර ඇත. තව දුරටත් ඔහු ප්‍රකාශ කර ඇත්තේ එම රෝගීන් මිහින්තලය රෝහලට රැගෙන ගිය බවත්ය. ඒ අන්දමට රෝගීන් රෝහලෙන් පිටව ගොස්

විනාඩි 10 ක කාලයක් ඇතුළතදී අභියාචක වෛද්‍යවරයා ආපසු රෝහලට පැමිණි බවටත් ඔහු ප්‍රකාශ කර ඇත.

අනතුරුව සාක්ෂි දී ඇති බිමල්කා උෂානි අමරසිංහ යන අය පවසා ඇත්තේද, ඉහතින් සඳහන් කළ සාක්ෂියට සමාන සාක්ෂියකි. ඇය ප්‍රකාශ කර ඇත්තේ, පස්වරු 4.15ට පමණ රෝගීන් පැමිණි බවත් ඒ අනුව ඇය ඒ බව අභියාචක වෙත දුරකථනයෙන් දැනුම් දුන් බවත්ය. එසේ දැනුම් දීමෙන් අනතුරුව විනාඩි 10 කටත් කලින් වෛද්‍යවරයා ආපසු රෝහල වෙත පැමිණි බවටත් පවසමින් ඇය පැහැදිළි ලෙස සාක්ෂි දී ඇත.

ඉහතින් සඳහන් සාක්ෂිවලින් පැහැදිළිව පෙනී යන්නේ, අභියාචක පස්වරු 4.00ට පමණ රෝහලෙන් පිටව ගොස් ඇති අතර, පස්වරු 4.15ට පමණ රෝගීන් රෝහල වෙත ගෙන ඒමෙන් අනතුරුව විනාඩි 10 ක කාලයක් තුළ අභියාචක නැවත රෝහලට පැමිණ ඇති බවයි. ඒ වන විටත් රෝගීන් වෙනත් රෝහලක් වෙත පිටත් කර යවා තිබුණි.

ඉහත සාක්ෂි අනුව පෙනී යන්නේ අභියාචක පැය භාගයක පමණ සුළු කාලපරිච්ඡේදයක් තුළ රෝහලෙන් පිටව ගොස් ඇතත්, අවශ්‍යතාවය දැනුම් දුන් වහාම, ඔහු ආපසු රෝහලට පැමිණ ඇති බවයි. අභියාචක වෛද්‍යවරයා මෙන්ම රෝහල් අධ්‍යක්ෂවරයාද පැහැදිළිව සඳහන් කර ඇත්තේ අභියාචක එක දිගට දින ගණනාවක් විවේකයකින් තොරව පැය 24 පුරාම රාජකාරියේ නියුතුව සිටි බවයි. මෙම රෝහලට සාමාන්‍යයෙන් දිනකට රෝගීන් 100-150 ක් අතර ප්‍රමාණයක් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන බවත්, ඔවුන් සියළු දෙනාම ඔහු විසින් පරීක්ෂා කළ බවත් අභියාචක ප්‍රකාශ කර ඇත. මෙම තත්ත්වය බොහොමයක් සාක්ෂිකරුවන් විසින් පිළිගෙන ඇත.

එවැනි තත්ත්වයක් යටතේ ඉතා සුළු කාලපරිච්ඡේදයකට අභියාචක රෝහලෙන් බැහැරව සිට තිබීම, අනුමැතියකින් තොරව කටයුතු කිරීමක් ලෙස සළකා බැලිය හැකිද, යන කරුණ පරීක්ෂා කර බැලිය යුතුය. අභියාචක සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ එදින පස්වරු 4.00න් පසුව සේවයෙන් බැහැරව සිටීමට ඔහු විසින් ඉල්ලීමක්ද කර තිබූ බවයි. එය තහවුරු කිරීම සඳහා වි.I වශයෙන් සළකුණු කර ඇති ලේඛනය

ඉදිරිපත් කර ඇත. එම ලේඛනය වෛද්‍යවරයා විසින් පවත්වාගෙන යනු ලබන ඔහුගේ එදිනෙදා ක්‍රියාකාරකම් දැක්වෙන ලේඛනයකි. එහි එක් පිටුවක සඳහන් වන්නේ අභියාචක දින තුනක් තුළ, අවස්ථා තුනකදී සේවයෙන් බැහැරව සිටීමට අවසර ඉල්ලා ඇති බවයි. සිද්ධිය සිදු වී ඇති 2014.07.18 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වෙත සේවයෙන් බැහැර වීම සඳහා කරන ලද ඉල්ලීම එහි සඳහන් වේ. 2017.07.17 සහ 2017.07.19 දිනයන්හිද, අභියාචක විසින් එවැනි ඉල්ලීම් කර ඇති බවක්ද එහි සඳහන් වේ. ඒ අනුව එම සාක්ෂිය ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් නැත. එකී ලේඛනය පැමිණිල්ලේ සාක්ෂිකරුවන් වෙත ද ඉදිරිපත් කරමින් ඒ සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න ඇසීමටද අවකාශ ලබා දී ඇත. හරස් ප්‍රශ්න වලින් එම තත්ත්වය බිඳ හෙලා නැත. පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා, එම සාක්ෂිය කෙරෙහි අවධානය යොමු කර ඇති බවක් පෙනී යන්නේ නැත.

විධිමත් විනය පරීක්ෂණයේදී පැමිණිල්ලෙන් කැඳවනු ලැබූ සාක්ෂිකරුවන්ගෙන් අනතුරුව, අභියාචක විසින් පරීක්ෂණ නිළධාරියා ඉදිරියේ ප්‍රකාශයක් ලබා දී ඇත. එය හරස් ප්‍රශ්නවලට භාජනය වූ සාක්ෂියක් නොවේ. එබැවින් හරස් ප්‍රශ්න වලට භාජනය වූ සාක්ෂියක තරම් වටිනාකමක් එම සාක්ෂිය තුළින් මතු නොවේ. එය එසේ වුවත්, එම ප්‍රකාශය කෙරෙහි කිසිදු ආකාරයක අවධානය යොමු කිරීමක් විධිමත් විනය පරීක්ෂණය පැවැත්වූ නිළධාරියා විසින් කරන ලද බවක් නොපෙනේ. එම ප්‍රකාශය හරස් ප්‍රශ්න වලට භාජනය නොවුවත්, එය එක එල්ලේ බැහැර කිරීමටද නොපුළුවන. එබැවින් වී.I වශයෙන් සළකුණු කර ඇති ලේඛනයේ සඳහන් කරුණු මේ අවස්ථාවේදී එකවර ප්‍රතික්ෂේප කළ නොහැක. එයින් පෙනී යන්නේ අභියාචක සේවයෙන් ඉවත්ව යාම සඳහා ඉල්ලීමක්ද කර ඇති බවයි. එවැනි තත්ත්වයක් යටතේ අවසරයකින් තොරව සේවයෙන් බැහැරව සිටියා යැයි කියන චෝදනාව ස්ථිර ලෙසම තහවුරු වන්නේ නැත.

මෙහිදී සඳහන් කළ යුතු තවත් කරුණක් වන්නේ, තම්මැන්නාව රෝහලේ කාර්යභාර නිළධාරියා වශයෙන් අභියාචකට හිමි විය යුතු නිළ

නිවාසය ඔහුට ලබා දී නොතිබීමයි. එම නිළ නිවාසය එවකට භාවිතා කරමින් සිට ඇත්තේ, මිහින්තලය රෝහලේ සේවය කළ වෛද්‍යවරයකු විසිනි. එම වෛද්‍යවරයාද, එම තත්ත්වය සාක්ෂි දෙමින් පිළිගෙන ඇත. එවැනි තත්ත්වයක් යටතේ අභියාචක නිළ නිවාසයක් නොමැතිව දින ගණනාවක් පැය 24 මුළුල්ලේම සේවය කිරීමෙන් පසුව, පැය භාගයකටත් වඩා අඩු කාලපරිච්ඡේදයක් තුළ සේවායෙන් බැහැරව සිටීම අනුමැතියකින් තොරව සේවයෙන් බැහැරව කටයුතු කිරීමක් ලෙසට සලකා කටයුතු කළ නොහැක.

තවද, සම්පූර්ණ දිනය පුරාම සේවයේ නිරත වීමෙන් පසුව, පස්වරු 4.00 ළඟා වීමෙන් අනතුරුව ඔහු නැවතී සිටි ස්ථානයට යාමට සිදුවූයේ නම්, එහි වරදක් පෙනෙන්නට නැත. ඔහු විසින් ඔහුගේ කෑම, බීම පිළියෙල කර ගැනීම සහ අනෙකුත් අවශ්‍යතා සඳහා යාමෙහි නිරත වූයේ නම්, ඒ සඳහා ඔහු අවසරයක් ගත යුතු වන්නේද යන ප්‍රශ්නය පැන නඟී.

ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව තවදුරටත් පෙනී යන්නේ, රෝහල වෙත රැගෙන එන ලද රෝගීන් ඒ මොහොතේම මිහින්තලය රෝහල වෙත මාරු කර යවා ඇති බවයි. රෝහල් දෙක අතර දුර ප්‍රමාණයද කිලෝමීටර 12ක් පමණ වන අතර, විනාඩි 15ක පමණ කාලයකින් එහි ළඟාවීමටද හැකියාව ඇත. තම්මැන්නාව රෝහල සඳහා ගිලන් රථයක්ද වෙන් කර තිබූ බව සාක්ෂි වලින් හෙළිදරව් වේ. එවැනි තත්ත්වයක් තිබියදී අභියාචක වෛද්‍යවරයා එම රෝහලේ සේවයේ නිරතව සිටියේ වුවත්, රෝගීන්ගේ බරපතල තත්ත්වය සළකා බලන විට, ඉහත කී ක්‍රියාමාර්ගය හැර වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාව තිබුනේද යන්නද පරීක්ෂා කර බැලිය යුතුය. එබැවින් අභියාචක රෝහලේ නොසිටීම සහ රෝගීන්ගේ බරපතලකම පමණක් සළකා බලා අභියාචක වෙත දඬුවම් පැමිණවීම නිසි පියවර නොවේ.

ඉහත කී කරුණු පරීක්ෂා කර බැලීමේදී පෙනී යන්නේ අභියාචක රෝහලෙන් අවසරයකින් තොරව පිටව ගොස් ඇත්තේ, චේතනාත්මකව අවසර නොගෙන සිටීමේ අදහසකින් නොවන බවයි. මෙම තත්ත්වය යටතේ, II සහ III චෝදනාවලට අභියාචක වරදකරු කිරීම දෝශ සහිත බවට තීරණය කරමු.

ඉහත කරුණු සලකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට ඉඩ දීමට තීරණය කරමු. ඒ අනුව අභියාචකට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2023.11.09 දිනැති ලිපිය මඟින් අභියාචකට එරෙහිව ගෙන ඇති තීරණය දෝශ සහිත බවට තීරණය කරමු. ඒ සමඟම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින්, 2023.03.02 දිනැති ලිපිය මඟින් අභියාචක වෙත පනවා ඇති දඬුවමද ඉවත් කිරීමට තීරණය කරමින් ඉදිරිපත් කර ඇති II සහ III චෝදනා දෙකෙන්ද, අභියාචක නිදොස් කොට නිදහස් කිරීමට වැඩිදුරටත් තීරණය කරමු. මෙම තීරණයන් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

අභියාචනයට ඉඩ දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/-